# ජාතික ලුණු සමාගම

## ඇබෑර්තු

ජාතික ලුණු සමාගම යනු, කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන රජයට අයත් සමාගමකි.

අලිමංකඩ ලුණු ලේවායේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා ස්ථාවර පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | තනතුරු ගණන | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01 | කාර්මික ශිල්පී | PL - 03 | 01 | අලිමංකඩ ලුණු ලේවාය |
| 02 | විදුලි කාර්මික | PL - 03 | 01 | අලිමංකඩ ලුණු ලේවාය |

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**වෘත්තීය සුදුසුකම්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හතර (04) තලයට නොඅඩු, එක් එක් තනතුරක කාර්යභාරයට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙනින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම **හෝ**

ආයතනයේ, ප්‍රාථමික තලයේ අර්ධ පුහුණු (PL2) හෝ නුපුහුණු (PL-1), අදාළ ක්ෂේත්‍රයේ අවම වසර පහක (05) කාර්ය පළපුරුද්ද සමග වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) දෙක (02) තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව සම්පූර්ණ කළ සේවකයන්.

**වැටුප :** ප්‍රාථමික තලයේ පුහුණු PL3-2016: 26,290, 10x270, 10x300, 10x330, 12x350= 39,490/=

එයට අමතරව, ජීවන අංක දීමනාව ලෙස රුපියල් 7800/= ද විශේෂ දීමනාවක් ලෙස රුපියල් 5,000/= ද ගෙවනු ලැබේ.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවකුම**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii) තනතුරේ රාජකාරී නිසි අයුරු ඉටු කිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට හැකි පරිදි හොඳ මානසික හා ශාරීරික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

කරුණාකර ඔබගේ අයදුම්පත් ජීවදත්ත හා සහතිකවල පිටපත් සහිතව, ලියාපදිංචි තැපැලෙන් 2022.08.29 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බවත්, කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන බවත් කරුණාවෙන් සලකන්න.

**සභාපති, ජාතික ලුණු සමාගම,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**